# ක්‍රෝධය ඇති වීමට හේතු දහයකි

## ආඝාතවස්තු සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අඞ්ගුත්තර නිකාය 6 - පිටු අංක 266 - 267 )

ආඝාතය(ක්‍රෝධය) ඇති වීමට හේතු දහයකි. කවර දහයක් ද යත්;

1. ‘මට අනර්ථයක් (අයහපතක්, අවැඩක්) කළේ’ යැයි ආඝාතයෙන් බැඳෙයි.
2. ‘මට අනර්ථයක් කරයි’ යැයි ආඝාතයෙන් බැඳෙයි.
3. ‘මට අනර්ථයක් කරන්නේ’ යැයි ආඝාතයෙන් බැඳෙයි.
4. ‘මාගේ ප්‍රිය මනාපයන්ට අනර්ථයක් කළේ’ යැයි ආඝාතයෙන් බැඳෙයි.
5. ‘මාගේ ප්‍රිය මනාපයන්ට අනර්ථයක් කරයි’ යැයි ආඝාතයෙන් බැඳෙයි.
6. ‘මාගේ ප්‍රිය මනාපයන්ට අනර්ථයක් කරන්නේ’ යැයි ආඝාතයෙන් බැඳෙයි.
7. ‘මාගේ අප්‍රිය අමනාපයන්ට අර්ථයක් කළේ’ යැයි ආඝාතයෙන් බැඳෙයි.
8. ‘මාගේ අප්‍රිය අමනාපයන්ට අර්ථයක් කරයි’ යැයි ආඝාතයෙන් බැඳෙයි.
9. ‘මාගේ අප්‍රිය අමනාපයන්ට අර්ථයක් කරන්නේ’ යැයි ආඝාතයෙන් බැඳෙයි.
10. අස්ථානයෙහි ද ආඝාතයෙන් බැඳෙයි.

මේ දස ආඝාත වස්තු වෙයි.